L

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-12-04 |

පැමිණිලි පාර්ශවය : සි. එස්. වික්‍රමආරච්චි මයා,
නො 34, ආනන්ද පටුමග,
මරදාන, කොළඹ 10.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
ආනන්ද විද්‍යාලය,
කොළඹ 10.

<u>පැමිණිලි අංකය : **HRC/3297/18**</u>

පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් 2018-12-28 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් (CO 350) ආසන්නතා ගණය යටතේ පැමිණිලිකරුගේ දරුවා වන හිරුන් හස්මල් වික්‍රමාරච්චි ඉහත කී වගඋත්තරකාර විද්‍යාලයේ 2019 වසරේ පළමු වසරට ඇතුලත් කිරිමේ අරමුණින් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත් වූවද කිසිදු ලකුණක් ලබා නොදුන් බැවින්, අභියාචනා මණ්ඩලයටද ඉදිරිපත් වූ නමුත් එහිදිද කිසිදු ලකුණක් ලබා නොදුන් බවයි..

තවද, මෙම පැමිණිලිකරු තම මිත්තණියගේ නිවසේ වසර 41ක් (උපන්දා සිට මේ දක්වා) මෙම නිවසේ මිත්තණිය සමග ජිවත් වන අතර, පැමිණිලිකරුගේ ඡන්ද නාම ලේඛනය, විවාහ සහතිකය, ජාතික හැඳුනුම්පත, දරුවාගේ උප්පැන්න සහතිකය ආදි සියලු ලිපිලේඛන මෙම මිත්තණියගේ නිවසේ ලිපිනයට ඇති බවත්, ඉඩමේ ඔප්පුව තමාට නොමැති බැවින්, අයදුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදි මිත්තණියගේ දිවුරුම් ප්‍රකාශයක්ද ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

ඒ අනුව තම දරුවාට මෙම පාසලට ඇතුලත් වීමට අවශ්‍ය සුදුසුකම් වූ ඡන්ද නාම ලේඛනය සඳහා ලකුණු 25ක්ද, අමතර ලේඛන සඳහා ලකුණු 05ක්ද, නිවසේ සිට පාසලට ඇති දුර සම්බන්ධයෙන් ලකුණු 40ක්ද, ඒ අනුව මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 70ක් බවද, පාසලට ආසන්නතා ගණය යටතේ ළමුන් ඇතුලත් කර ගැනීමේ අවම ලකුණු ප්‍රමාණය 61.7ක් වන බවද සඳහන් කර ඇත. එයින් තමාට අසාධාරණයක් සිදු වූ බව පැමිණිලිකරු කොමිෂන් සභාව දන්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර සාධාරණයක් ඉටු කර දෙන මෙන් ගරු මානව හිමිකම් කොමිෂන් සභාවෙන් සහන වශයෙන් අයැද සිට ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

පැමිණිල්ලට අදාලව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත්තේ, චක්‍රලේඛනය ප්‍රකාරව හිමිකම් ඔප්පුවක් නොමැති බවත්, නමුත් පැමිණිලිකරු එම නිවසේ දිර්ඝ කාලයක් තම මිත්තනිය සමග මේ දක්වාම ජිවත් වන බවත්ය.

පැමිණිලිකරුගේ උප්පැන්න සහතිකය, ඡන්ද නාම ලේඛනයේ අවුරුදු 20ක වඩා පැරණි බවත්, විවාහ සහතිකය, ජල බිල්පත්, දරුවාගේ උප්පැන්න සහතිකය ආදි සියලු ලේඛන පැමිණිලිකරුගේ ඉහත ලිපියෙන් පදිංචි බව සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති නමුත්, පැමිණිලිකරුට හිමිකම් ඔප්පුවක් නොමැති වීම මත සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදි කිසිදු ලකුණක් ලබා නොදී ප්‍රතික්ෂේප කර ඇති බවත් දක්වා ඇත.

කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු අවුරුදු 40ක පමණ කාලයක් මිත්තණිය සමග පැමිණිලිකරු ඉල්ලුම් කරන ලද ලිපිනයේ පදිංචි බව ලේඛන වලින්ද, වගඋත්තරකරුගේ ප්‍රකාශ අනුවද සනාථ වේ. මෙම පැමිණිලිකරුගේ උප්පැන්න සහතිකය, හැඳුනුම්පත, ඡන්දය, ජල බිල්පත්, විවාහ සහතිකය, සහ දරුවාගේ උප්පැන්න සහතික යන ලේඛන පැමිණිලිකරු පදිංචි ස්ථානයට ඇති අතර, හිමිකම් ඔප්පුව නොමැති බව දෙපාර්ශවයේ කරුණු අනුව පැහැදිලි වේ.

ඒ අනුව පැමිණිලිකරුට මෙම පාසලට ඇතුලත් වීමට අවශ්‍ය සුදුසුකම් වූ ඡන්ද නාම ලේඛනය සඳහා ලකුණු 25ක්ද, අමතර ලේඛන සඳහා ලකුණු 05ක්ද නිවසේ සිට පාසලට ඇති දුර සඳහා ලකුණු 40ක්ද වශයෙන් මුළු ලකුණු 70ක් උපයා ගැනීමට අවස්ථාව තිබූ අතර, පාසලට ළමුන් ඇතුලත් කිරීමේ අවම ලකුණු සීමාව 61.7 වන බවත්, එම ලකුණු ප්‍රමාණය ඉක්මවා ලකුණු ලබා

ගැනීමට පැමිණිලිකරුට හැකියාවක් ඇති බවත් ඉහත ලේඛන අනුව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වේ.

2017-07-01 දිනැතිව අංක 22/2017 (1) චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියලුම පාසල් විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති අතර, එම චක්‍රලේඛය අනුව ඉහත කී 22/2017 චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇති බවට දක්වා තිබීම හේතුවෙන් පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ අවස්ථාව වන විට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට නීතියෙන් අවස්ථාවක් ලැබී තිබූ බවට නිරීක්ෂණය වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2017-09-19 වන දින සියලුම පාසැල් වල විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති ලිපියෙහි දෙවන ඡේදය කෙරෙහි අවධානය යොමු කිරීමේදි " පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුලත් කිරීමට අදාළ 2017-05-30 දිනැති 22/2017 චක්‍රලේඛය සම්බන්ධයෙන් විවිධ පාර්ශව වලින් තවදුරටත් ඉදිරිපත් වූ අදහස් හා යෝජනා අනුව 22/2017 (1) චක්‍රලේඛනය මගින් සංශෝධනය සිදු කර ඇත. මෙම සංශෝධනය අනුව චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය ඉවත් කර ඇතත්, එක් එක් ගණයක් යටතේ නිර්නායකයන්ට හිමිවන ලකුණු සම්පූර්ණයෙන් ප්‍රතික්ෂප කළ යුතුය යන්න එමගින් ගම්‍ය නොවේ " වශයෙන් දක්වා ඇත. තවද එම ලිපියේ 3 වන ඡේදයට අනුව " 22/2017 චක්‍රලේඛනයේ අදාළ ගණයන් හය සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාළ ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාළ ගණයට හිමිකම් නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූණයෙන් ලකුණු ලබාදීම ප්‍රතික්ෂෙප නොකළ යුතුය.. යනුවෙන් දක්වා ඇත. පැමිණිලිකරු ආසන්නතා පදනම මත මූලික සුදුසුකම් සපුරා ඇත.

" 22/2017 චක්‍ර ලේඛයේ අදාළ ගණයන් සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාළ ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාළ ගණයට හිමිකම් නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණ ලකුණු ලබා දීම ප්‍රතික්ෂෙප නොකළ යුතු බව " දන්වා ඇත.

තවද, එක් නිර්ණායකයක් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම මත අනෙක් නිර්ණායක සඳහා ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කළ නොහැකි බව සඳහන් කරමින් වෙනුර තන්විදු සහ එස්.ටී

කොඩිතුවක්කු එරෙහිව බී.ජී අබේරත්න, විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලය **SCFR 62/2018** හි ප්‍රකාශ වූයේ පදිංචිය සනාථ කිරීමට නොහැකි වීම පදනම් කරගෙන ඉතිරි තීර්ණායක සඳහා ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම තුලින් පෙත්සම්කරුට අසාධාරණයක් සහ 12(1) වගන්තිය ප්‍රකාරව මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවී ඇති බවයි.

එසේම පුෂ්පරාජන් රොහාන් එරෙහිව කාරියවසම් **SC FR 06/2017** නඩුවෙහිදීද පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන අතරින් එක් එක් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ පමණින්, ඒ මත ඉතිරි තීර්ණායක සඳහා ලකුණු ලබා නොදීමට පාසල ගත් තීරණය අත්තනෝමතික තීරණයක් බවට සනාථ කොට ඇත.

නිගමනය හා නිර්දේශය :-

පාසලට ඇතුලත් විමේ අවම ලකුණු සීමාව 61.7ක් වන අතර, පැමිණිලිකරුගේ ලේඛන අනුව පැමිණිලිකරුට ලකුණු 70ක් උපයා ගැනීමට හැකියාව තිබියදී වගඋත්තරකාර පාර්ශවය විසින් චක්‍රලේඛනයට පටහැනිව කටයුතු කිරීම තුලින් පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුලත් වී අධ්‍යාපන කටයුතු කිරීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන හිරුන් හස්මල් වික්‍රමාරච්චි දරුවා 2019 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතලත් කර ගැනීමට කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.12.27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| රමණි මුත්තෙට්ටුවේගම | එච්. ගසාලි හුසේන්, |
| කොමසාරිස්, | කොමසාරිස්, |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| **Commissioner**<br>Human Rights Commission of Sri Lanka<br>No. 14, R.A. De Mel Mawatha,<br>Colombo 04. | **Commissioner**<br>Human Rights Commission of Sri Lanka<br>No. 14, R.A. De Mel Mawatha,<br>Colombo 04. |

පිටපත :- 1. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/